
## ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ මූලෝපායක්/ සැලසුමක් යනු කුමක් ද?

ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ මූලෝපායන්/ සැලසුම් සංවර්ධනය කරනු ලබන්නේ රජය සමග එක් වුණ පළාත් පාලන ආයතන විසින් ය. ඒ ගෝලීය හා ජාතික රාමුවලට අනුකූලව ය. ආයෝජන සහ සැලසුම් මගින්, කාල ශ්‍රේණි අරමුණු මෙන් ම අයවැය සැකසුම් සමග අලුත් ආපදා වැළැක්වීමට සහ තිබෙන ආපදා අවදානම් අවම කිරීම සඳහා ආපදාවන්ට එරෙහි නිශ්චිත ක්‍රියාමාර්ග අවශ්‍ය ය. බොහෝ ප්‍රජා පාදක (රාජ්‍ය නොවන) ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් වනාහි ස්වයං උපකාරී හෝ අන්‍යෝන්‍ය උපකාරී ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම් වේ. ඒවා ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම්වලට සහායක වේ. මෙම අර්ථ නිරූපණය විසින් අනුගමනයය කරනු ලබන්නේ සෙන්ඩයි රාමුව සහ එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම් අවම කිරීමේ වාංමාලාවයි.

## ශේෂ අවදානම් (residual risks) යනු මොනවා ද?

ශේෂ අවදානම් යනු තව දුරටත් ඉතිරි වී තිබෙන අවදානම් ය. ඒවා ඇති වන්නේ ව්‍යුහාත්මක ක්‍රියාමාර්ගවල සැලසුම් පරිමාණ, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, අනපේක්ෂිත මහා පරිමාණ ආපදා ආදිය නිසා ය. ක්‍රියාගිමාර්ග ගැනීම සඳහා යම් කාලයක් ගත වෙන බැවින් එම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අනුව ශේෂ අවදානම් වෙනස් වේ. එබැවින්, ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම්වලදී වෙනස් වූ තත්වයන්ට අනුව හැඩගැසීමට සලකාබැලීම අවශ්‍ය ය.




## පොදු ආයතන ලෙස ජාතික ආණ්ඩුවේ සහ පළාත් පාලන ආයතනවල භූමිකා මොනවා ද?

ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය හා ආයතනික රාමුව පවත්වාගෙන යාමේ සහ අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම වැනි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ මූලික වගකීම තිබෙන්නේ ජාතික ආණ්ඩුවට ය. ජාතික ආණ්ඩුව විසින් අදාළ සංවිධාන සම්බන්ධීකරණය කර, පළාත් පාලන ආයතනවලට ක්‍රියාත්මක කිරීමේ ව්‍යූහයක් පිහිටුවීම සඳහා ආධාර කරනු ලැබේ. පදිංචිකරුවන්ට සහ ප්‍රජාවන්ට මුහුණ දෙන්නට සිදු වන ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ වගකීම තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට ය. ක්‍රියාමාර්ග ආදිය අධ්‍යයනය කිරීමේ, සැලසුම් කිරීමේ, අයවැය වෙන්කිරීමේ, මෙහෙයවීමේ සහ නඩත්තු කිරීමේත්, නිරීක්ෂණය සහ තක්සේරු කිරීමේත් වගකීම් එයට අයත් වේ. පළාත් පාලන ආයතන විසින් පාර්ශ්වකරුවන්ට උපදෙස් සහ මගපෙන්වීම් සපයනු ලැබේ. ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රමිති ආරක්ෂා කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩතාව රැකගැනීමේ සැලසුම් වැනි පෞද්ගලික අංශයේ ස්වයං ආරක්ෂණ ක්‍රියාමාර්ග උදාහරණ වේ. එමගින් කරනුයේ ආපදා අවම කිරීම සඳහා තමන්ට ම කළ හැක්කේ කුමක්දැයි හඳුනාගැනීමයි.

## 2020 දක්වා අවධානය යොමු කළ යුතුව තිබෙන්නේ කුමන ප්‍රදේශවලට ද?

අධික ආපදා අවදානම් ඇති ප්‍රදේශවලට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය. ඒවායේ හදිසි සහ කාර්යක්ෂම ප්‍රතික්‍රියාමාර්ග අවශ්‍ය ය. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය කලාපවලින් 20%ක් තුළ ඇති සමස්ත ආපදා අවදානම 80%ක් නම්, අනෙක් ප්‍රදේශවලට පෙර වහාම මෙම ප්‍රදේශවල ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සකස් කළ යුතු ය.




## ප්‍රායෝගික ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සහිත පළාත් පාලන ආයතන සංඛ්‍යාව වැඩි කළ හැකි ආකාර මොනවා ද?

ජාතික ආණ්ඩු විසින් ක්‍රියාවලිය පරිස්සමෙන් නිරීක්ෂණය කළ යුතු ය. එමගින් ආදර්ශ සැලැස්මක් යාන්ත්‍රික ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම වළක්වාගත හැකි ය. නාගරික හා ග්‍රාමීය තත්වයන්, සමාජ ආර්ථික තත්වයන්, උපද්‍රව වර්ග හා ඒවායේ ව්‍යාප්තිය, ඉඩම් භාවිතය, පාලනය, මූල්‍ය ආදී කරුණු මත ප්‍රාදේශීය ලක්ෂණ වෙනස් වේ. නිශ්චිත ප්‍රදේශයක ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ අත්හදාබැලීමේ සැලැස්මක් මගින් ලබාගන්නා අත්දැකීම් ඇසුරෙන් ප්‍රදේශයට ගැලපෙන සැලැස්මක් සකස් කරගත හැකි ය. වෙනත් ප්‍රදේශ කරා ප්‍රයෝජනවත් දැනුම එලදායී ලෙස බෙදාහැරීම සඳහා පහත දැක්වෙන කරුණු වැදගත් වේ. විවිධ තත්වයන් සහ ලක්ෂණ තිබෙන ආදර්ශ ස්ථාන තෝරාගැනීමේ නිර්ණායක, ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සංවර්ධනය කිරීම සඳහා සවිස්තර කාර්යයන් සහ ප්‍රායෝගිකව ලබාගත හැකි අයවැයකට ගැලපෙන පරිදි සැලසුම හැඩගැස්වීම.

Japan International Cooperation Agency (JICA)
Global Environment Department, Disaster Risk Reduction Group
TEL: +81-3-5226-3172 E-mail: Oba.Takashi@jica.go.jp; Goto.Ko@jica.go.jp

ver.20190510

# පියවර 8

# ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ මූලෝපායන්/ සැලසුම් සංවර්ධනය කිරීමේ ප්‍රායෝගික ක්‍රම

### සෙන්ඩයි රාමුවේ ගෝලීය ඉලක්ක අත්පත් කරගැනීම දක්වා

### පියවර 8 යනු කුමක්ද? එය භාවිතා කරන්නේ කවුරුද?

පියවර 8 යනු, සංයුක්ත ආයෝජන ක්‍රම සහිතව ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ මූලෝපායන්/ සැලසුම් සංවර්ධනය කිරීමේ ප්‍රායෝගික ආකාරයයි.

ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සකස් කර තිබෙන්නේ සංවර්ධිත රටවල් කීපයක් විසින් පමණි. එසේ සකස් කර තිබෙන බොහෝ සැලසුම් ද සමන්විත වන්නේ ‘ප්‍රතිචාරාත්මක’ ක්‍රියාමාර්ගවලින් පමණක් මිස ‘අවම කිරීමේ’ ක්‍රියාමාර්ගවලින් නොවේ.

මෙම පියවර 8 විසින් විශේෂයෙන් ම ප්‍රාදේශීය නායකයන්ට සහ සැලසුම්කරුවන්ට ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් අලුතෙන් නිර්මාණය කිරීමට හෝ සංවර්ධනය කිරීමට ද ශේෂ අවදානම් වෙනුවෙන් ආයෝජනය කිරීමට සහ ස්ථාවරව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීමට ද හැකියාව ලබාදෙයි.


# ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්මක් සංවර්ධනය කිරීමේ 8 පියවර

## 1 පියවර ප්‍රාදේශීය උපද්‍රව තොරතුරු එක්රැස් කිරීම

- ✓ ජාතික හෝ ඉහළ අධිකාරියක් මගින් සකස් කරන ලද ආපදා තොරතුරු අධ්‍යයනය කිරීම.
- ✓ උපද්‍රව තොරතුරු ප්‍රමාණවත් නැතිනම්, කාලය හා පිරිවැය කාර්යක්ෂමතාව උදෙසා, ඒ වෙනුවට, ඓතිහාසික ආපදා වාර්තා පාවිච්චි කරන්න.

*<ප්‍රධාන ප්‍රශ්න>*

- ☐ *පැවතිය හැක්කේ කුමන ආකාරයේ උපද්‍රව ද?*
- ☐ *මෙම ආපදා තිබෙන්නේ කොහි ද?*




## 2 පියවර ප්‍රාදේශීය ආපදා අවදානම් තේරුම්ගැනීම

- ✓ සංවර්ධනයට බාධාකාරී ලෙස දැනට පවත්නා අවදානම් සහ විය හැකි අනාගත අවදානම් හඳුනාගන්න.
- ✓ මහා පරිමාණ ප්‍රතිඵල ඇති කරන අවදානම් හඳුනාගෙන ප්‍රමුඛතාව අනුව පෙළගස්වන්න.
- ✓ ප්‍රමුඛ අවදානම් කෙරෙහි 2020 දක්වා අවධානය යොමු කරන්න. අනෙක් ඒවාට 2020න් පසු අවධානය යොමු කරන්න.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *අවදානම් ඇත්තේ කුමන ප්‍රදේශවලට ද? ඇයි?*
- ☐ *අනාගතයේදී අවදානම් ඇති විය හැක්කේ කුමන ප්‍රදේශවල ද? ඇයි?*
- ☐ *අවදානමෙන් ඉහළ කුමන වර්ගයේ ආපදා ද?*
- ☐ *නාගරික සංවර්ධන සැලැස්මේ තිබෙන අන්තර්ගතය සහ ප්‍රගතිය කුමක් ද?*
- ☐ *මිනිසුන් ජීවත් වන්නේ කොහි ද?*
- ☐ *වැදගත් යටිතල පහසුකම් සහ මූලික සේවා පහසුකම් මොනවා ද? ඒවා පිහිටා ඇත්තේ කොහි ද?*




## 3 පියවර ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් ජාතික හා ප්‍රාදේශීය අධිකාරීන් විසින් තහවුරු කිරීම

- ✓ ජාතික ආණ්ඩු විසින් සංවර්ධනය කර තිබෙන නාගරික සැලසුම් සහ ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් අධ්‍යයනය කර, සෑම ආපදා වර්ගයක් සඳහා ම ප්‍රධාන ව්‍යුහාත්මක ක්‍රියාමාර්ග තහවුරු කරන්න.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *හඳුනාගත් අවදානම් කලාප අවම කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙන ව්‍යාපෘති තිබේ ද?*
- ☐ *හඳුනාගත් අවදානම් කලාප අවම කිරීම සඳහා නුදුරු අනාගතයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති තිබේ ද?*
- ☐ *ආපදා අවදානම් අවම කිරීම සමග සම්බන්ධ සංවිධාන මොනවා ද?*





## 4 පියවර කාල ශ්‍රේණි සැලකිල්ලට ගනිමින් ශේෂ අවදානම් හඳුනාගැනීම

- ✓ ව්‍යුහාත්මක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අධ්‍යයනය කරන්න. ඒවා සම්පූර්ණ වී අවදානම්වලින් ආරක්ෂා කිරීමේ ඵලදායිතාව පෙන්වීමට කාලයක් ගත වේ.
- ✓ කාල ශ්‍රේණි සමග සම්බන්ධ ශේෂ අවදානම්වල වෙනස හඳුනාගන්න.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *දැනට සිදු වන සහ සැලසුම් කර තිබෙන ව්‍යාපෘති සම්පූර්ණ කිරීමෙන් අවම වන්නේ කුමන ආපදාවන් ද?*
- ☐ *එම ව්‍යාපෘති සියල්ල සම්පූර්ණ කිරීමට කෙතරම් කාලයක් ගත වේ ද?*
- ☐ *ඉතිරි වී තිබෙන අවදානම් මොනවා ද?*



## 5 පියවර පළාත් පාලන ආයතන විසින් ගනු ලබන සියලු ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ලැයිස්තුගත කිරීම

- ✓ ශේෂ අවදානම් අවම කිරීම සම්බන්ධ ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග ඇතුළු අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න.
- ✓ ඉඩම් භාවිතය වැනි පළාත් පාලන ආයතන විසින් සංවර්ධනය කරන ලද වෙනත් අදාළ සැලසුම් අධ්‍යයනය කර ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්මට ඇතුළත් කරන්න.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *අවදානම් අවම කිරීමට දායක වන්නේ කුමන ආකාරයේ ක්‍රියාමාර්ග ද?*
- ☐ *එම ක්‍රියාමාර්ග වර්ගීකරණය කර තිබෙන්නේ කුමන ආකාරයෙන් ද? කෙටි කාලීන, මධ්‍යම කාලීන සහ දිගු කාලීන යන අතරින් කුමක් ද?*
- ☐ *එම ක්‍රියාමාර්ග ගත හැක්කේ ආණ්ඩුවේ කුමන මට්ටමට ද?*



## 6 පියවර ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමුඛතාව අනුව පෙළගැස්වීම

- ✓ ශක්‍යතාව, පිරිවැය කාර්යක්ෂමතාව, මූල්‍ය සම්පත් ආදිය සැලකිල්ලට ගනිමින් ශේෂ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ලැයිස්තුවක් සකස් කරන්න.
- ✓ ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග අතර හොඳම තුලනය සොයන්න.
- ✓ සංවර්ධිත සැලසුම් වෙනුවෙන් පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත සහ රජයේ අනුමැතිය ලබාගන්න.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *ශේෂ අවදානම් අවම කිරීමෙහිලා වඩාත් ම වැදගත් වන්නේ කුමන ක්‍රියාමාර්ගය ද?*
- ☐ *අවදානම් අවම කිරීම සඳහා ඊළඟට වැදගත් ක්‍රියාමාර්ග මොනවා ද?*
- ☐ *මෙම ක්‍රියාමාර්ග ඇත්ත වශයෙන් ම ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද?*




## 7 පියවර අවශ්‍ය මට්ටම්වලින් අයවැය ප්‍රතිපාදන සකස්කරගැනීම

- ✓ ක්‍රියාත්මක කිරීමේ වියදම් දරන වගකීම ඇති සංවිධානය හඳුනාගන්න. අයවැය ප්‍රමාණවත් නැතිනම්, අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් සෙවීමට ක්‍රියාමාර්ග අවශ්‍ය ය.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *මේ හා සම්බන්ධ සංවිධාන මොනවා ද?*
- ☐ *අදාළ සංවිධාන වියදම් බෙදාගන්නේ කෙසේ ද?*
- ☐ *අදාළ සංවිධාන අතර සාකච්ඡා ක්‍රියාවලිය කුමක් ද? (උදා: නායකයන්ගේ අනුමැතිය ලබාගැනීමට සභාවලට සහභාගී වීම, භාණ්ඩාගාරය සමග සන්නිවේදනය, ආධාරක සංවිධානවලට යෝජනා ඉදිරිපත් කිරීම ආදිය)*




## 8 පියවර ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ කාලානුරූපීව සමාලෝචනයකිරීම

- ✓ උපද්‍රව තොරතුරු සහ ජාතික ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් තත්වයේ වෙනසට හැඩගැසෙන පරිදි කාලානුරූපව සමාලෝචනය කර සංශෝධනය කරන්න.

*<වැදගත් ප්‍රශ්න>*

- ☐ *ක්‍රියාත්මක කිරීමේදී සංවිධානවල භූමිකාව සහ වගකීම් මොනවා ද?*
- ☐ *සැලසුම් සමාලෝචනය කළ යුත්තේ කොපමණ කාලයකට වරක් ද?*
- ☐ *සමාලෝචනය කළ යුත්තේ කුමන අයිතමයන් ද? (උදා: උපද්‍රව තොරතුරු, ජාතික ආපදා අවදානම් අවම කිරීමේ සැලසැම, ඉඩම් භාවිතය ආදිය)*
- ☐ *සමාලෝචන ක්‍රියාවලිය කුමක් ද?*

